සියලුම හිමිකම්ඇවිරිණි/All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகானக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය
දෙවන වාර පරීක්ෂණය 2019 මාර්තු
கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை 2019 மார்ச் தரம் 13 இரண்டாம் தவணைப் பரீட்சை
General Certificate of Education(Adv.Level) Grade 13 Second Term Test 2019 March

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව - II<br>Geography - II | 22 S II | කාලය පැය තුනයි<br>03 hours |

**සැලකිය යුතුයි**
**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**
**ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ ආකෘති සිතියම් එක බැගින් සපයනු ලැබේ.**

---

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

1. (i) ගෝලීය දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපාන ස්වාභාවික හේතු දෙකක් සඳහන් කරන්න (ලකුණු 02යි)

(ii) ගෝලීය දේශගුණික වෙනස්වීම් හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර පාරිසරික බලපෑම් තුනක් විස්තර කරන්න (ලකුණු 06යි)

(iii) ගෝලීය දේශගුණ වෙනස්වීම් කෙරෙහි පහත සඳහන් මානව ක්‍රියාකාරකම් කවර ආකාරයකින් බල පාන්නේදැයි විමසන්න
1.පොසිල ඉන්ධන දහනය
2.කාර්මීකරණය
3.කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය (ලකුණු 06යි)

(iv) ගෝලීය දේශගුණික වෙනස්වීම් හේතුවෙන් උද්ගතව ඇති පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

2. (i) පෘථිවි අභ්‍යන්තරයෙහි කබොල සහ ප්‍රාවරණය වෙන්වන සහ ප්‍රාවරණය සහ හරය වෙන්වන අසන්තතික කලාපයන් පිළිවෙළින් ලියා දක්වන්න (ලකුණු 02යි)

(ii) ආග්නේය පාෂාණ නිර්මාණ ක්‍රියාවලිය රූප සටහනක් අධාර කර ගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 06යි)

(iii) ශ්‍රී ලංකාවේ හඳුනාගතහැකි ප්‍රධාන පාෂාණ ශ්‍රේණි තුන නම් කර ඉන් එක් ශ්‍රේණියක සුවිශේෂී ලක්ෂණ දල ශ්‍රී ලංකා සිතියමක් ආධාර කර ගනිමින් විස්තර කරන්න (ලකුණු 06යි)

(iv) පාංශු නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි පහත දී ඇති සාධක කවර ආකාරයෙන් බලපාන්නේදැයි විස්තර කරන්න
1.මව් පාෂාණය 2.දේශගුණය 3.භූ විෂමතාව (ලකුණු 06යි)

3. (i) හිමාලය,රොකී,ඇල්ප්ස් වැනි කඳු පද්ධති නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි බලපා ඇති භූ චලන ප්‍රභේදය කවරක් ද? (ලකුණු 02යි)

(ii) ගංගා ඛාදන ක්‍රියාවලියෙහි භාරය පරිවහනය කරන ආකාර රූප සටහනක් ආධාර කර ගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 06යි)

(iii) සාගර තරංග නිධිසාධන ක්‍රියාවලිය හේතුකොටගෙන නිර්මාණය වන පහත දී ඇති භූ රූප,රූප සටහන් අධාර කර ගනිමින් පැහැදිළි කරන්න

1.වැල්ල
2.ටොම්බෝලෝ
3.වැලි පර සහ වැලි තුඩු (ලකුණු 06යි)

(iv) නාය යෑම් කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් සහ මානව සාධක එකක් විස්තර කරන්න

(ලකුණු 06යි)

4. (i) සපයා ඇති ලෝක සිතියමෙහි කේතුධර වනාන්තර බියෝමය ව්‍යාප්තව ඇති ප්‍රදේශ ලකුණු කර නම් කරන්න (ලකුණු 02යි)

(ii) නිවර්තන වර්ෂා වනාන්තර වල වෘක්ෂලතා ප්‍රජාවේ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න (ලකුණු 06යි)

(iii) ගෝලීය වනාන්තර බියෝමයන් වර්තමානයේ මුහුණ දී ඇති අභියෝග තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

(iv) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති මුහුණ දෙන ගැටලු අවම කර ගැනීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග තුනක් සාකච්ඡා කරන්න

(ලකුණු 06යි)

## II කොටස මානුෂ භූගෝල විද්‍යාව

5. (i) 2017 ජුනි මාසය වන විට ලෝකයේ වාර්තා වී ඇති මුළු ජනසංඛ්‍යාව බිලියන කොමණ ද ?

(ලකුණු 02යි)

(ii) ආසියා සහ අප්‍රිකානු කලාපවල ජන සංඛ්‍යාවේ සිදුවන වේගවත් වර්ධනය හේතුවෙන් මුහුණ දෙන අභියෝග තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

(iii) ජාත්‍යන්තර සංක්‍රමණය හේතුකොටගෙන ගමනාන්ත රටවල් මුහුණදෙන ධනාත්මක ප්‍රතිඵල සහ ඍණාත්මක ප්‍රතිඵල තුන බැගින් සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

(iv) ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී ඇති ජන සංඛ්‍යාව හා සම්බන්ධ ගැටලු වලට මුහුණ දීම සඳහා ජනවිද්‍යාත්මක ප්‍රතිපත්තීන් කවර ආකාරයෙන් සකස්විය යුතුදැයි විමසීමක් කරන්න (ලකුණු 06යි)

6. (i) නාගරීකරණය දේශ සීමා ඉක්මවා ව්‍යාප්ත වී ඇති බවට උදාහරණ දෙකක් සපයන්න (ලකුණු 02යි)

(ii) නාගරීකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන විස්තර කරන්න (ලකුණු 06යි)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය හේතුවෙන් මුහුණ දෙන ගැටලු තුනක් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

(iv) ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ අඩු නාගරික මට්ටමක් පැවතීම කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳව විමසිමකි කරන්න (ලකුණු 06යි)

7. (i) ජනාවාස යන්නට ඩිකින්සන් විසින් දී ඇති අර්ථ කථනය සඳහන් කරන්න (ලකුණු 02යි)

(ii) 'අතීතයේ ජනාවාස බිහිවීම කෙරෙහි බල පෑ සාධකයන්ට වඩා වර්තමානයේ ජනාවාස බිහිවීම කෙරෙහි බලපාන සාධකවල වෙනස්කම් සිදු වෙමින් පවතී' විමසන්න (ලකුණු 06යි)

(iii) ලෝකයේ ජනාවාස විකාශනය සිදු වූ ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

(iv) ශ්‍රී ලංකාවේ හඳුනාගතහැකි විවිධ ග්‍රාමීය ජනාවාස රටාවන් පිළිබඳව විස්තර කරන්න (ලකුණු 06යි)

8. (i) ශ්‍රී ලංකාවේ තලාතු මිනිරන් ව්‍යාප්තව ඇති මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න (ලකුණු 02යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ඛනිජ සම්පත්වල දායකත්වය පහත ක්ෂෙත්‍ර යටතේ විස්තර කරන්න

1.කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස 2.සේවා නියුක්තිය

3.ප්‍රාදේශීය සංවර්ධනය (ලකුණු 06යි)


(iii) ඛනිජ සම්පත් උපයෝජනයේ දී ඇතිවන පාරිසරික බලපෑම් පහත ක්ෂේත්‍ර යටතේ විස්තර කරන්න

1.ජල සම්පත 2.භූමි හායනය 3.වායු දූෂණය (ලකුණු 06යි)

(iv) ඛනිජ සම්පත් නිෂ්කර්ෂණයේ දී ඇතිවන පාරිසරික හානිය අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේද තුනක් සාකච්ඡා කරන්න (ලකුණු 06යි)

**22 භූගෝල විද්‍යාව II     13 ශ්‍රේණිය     දෙවන වාර පරීක්ෂණය 2019**

**I කොටසෙහි ප්‍රශ්න අංක 04 - (i) සඳහා**



The National e-learning Portal for The General Education

**II කොටසෙහි ප්‍රශ්න අංක 08 - (i) සඳහා**

